# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1989/35 – 2016 ඔක්තෝබර් 19 වැනි බදාදා – 2016.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, සිරිබෝපුර ගමේ පිහිටි, ප්‍රගමන අනුරේඛන අංක එච්/එච්එම්බී/2013/651 හා 2014.06.13 දිනැති පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – සිරිබෝපුර කැළේ – ප්‍රමාණය: හෙක්. 0.0095 උතුරට: බතම්පරය මාර්ගය; නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ); දකුණට සහ බටහිරට: එගොඩහේවාගේ ගුණවතී හිමිකම් කියන සිරිබෝපුර කැළේ.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

යොමු අංකය: 4-3/6/2014/එච්ඩබ්ලිව්/487.
2016 සැප්තැම්බර් මස 27 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

11 -141